ජනවාරි 9 වැනි දා 'කලම්බු ටෙලිග්‍රාෆ්' වෙබ් අඩවියේ පළවූ

Aspirant CJ Mohan Pieris Exposed: Professional Misconduct As Attorney General

ලිපියේ සිංහල පරිවර්තනය

## අගවිනිසුරු පදවියට ඉව අල්ලන මොහාන් පීරිස් හෙළිදරව් වීම:
### නීතිපතිව සිටියදී වෘත්තීය විෂමාචාරයේ යෙදීම

මොහාන් පීරිස් නීතිපති වශයෙන් පත්කරනු ලැබීමට පෙර, රෝයල් ෆර්න්වුඩ් පෝර්සිලේන් සමාගම වෙනුවෙන් පෙනී සිටිමින්, මූලික අයිතිවාසිකම් පෙත්සමක් (එස්.සී.එෆ්.ආර්. 360/2008) ගොනු කෙළේය. 06.10.2008 වැනි දා පෙත්සම්කරු (පෝර්සිලේන් සමාගම) වෙනුවෙන් පෙනී සිටින නීතිඥයා වශයෙන් සඳහන් වන්නේ මොහාන් පීරිස් ය. ඔහුගේ ඉල්ලීම පරිදි, නඩුව විභාගයට ගැනීම 10.11.2008 වැනි දාට කල් තැබුණි.

එදා පෙත්සම්කාර සමාගම වෙනුවෙන් කරුණු දක්වමින්, ''රේගු අධ්‍යක්ෂ ජෙනරාල්වරයාට කරුණු ඉදිරිපත් කරන ලදුව, පරිපාලනමය සහනයක් ලබාගැනීමේ ඉඩක් ඇති'' බව ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වා සිටියේය. නඩුව ඉදිරියට ගෙන යාමක් ඉල්ලා නොසිට, මේ පදනම උඩ, ඔහු තව දිනයකට කල් ඉල්ලීය. (එවකට) අගවිනිසුරු සරත් එන්. සිල්වා සභාපතිත්වය දැරූ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල, ''මේ කාරණය රේගු දෙපාර්තමේන්තුව සමග අවසානයක් කර ගැනීමට'' නිර්දේශ කොට, ඊළඟට 03.12.2008 වැනි දාට නඩුව කල් තැබීය.

එදා ද, අගවිනිසුරු සරත් එන්. සිල්වා සභාපතිත්වය දැරූ විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ මොහාන් පීරිස් ඉහත කී සමාගමේ නීතිඥයා වශයෙන් පෙනී සිටියේය. එහි දී, දඩය ලිහිල් කිරීමේ පදනම යටතේ පෙත්සම්කරු විසින් ගෙවිය යුතු යැයි තීරණය වූ මුදල කොපමණ ද යි ඊළඟ දවසේ අධිකරණයට දන්වා සිටින ලෙස අධිකරණය පෙත්සම්කාර පාර්ශ්වයට දැනුම් දුනි. මේ දිනයෙන් පසු පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටීම මොහාන් පීරිස් නතර කෙළේය. මේ අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ බොහෝ නිලධාරීන්ගේ බරපතල විවේචන සහ අප්‍රසාදය මැද්දේ, මොහාන් පීරිස්ව ජනාධිපතිවරයා විසින් නීතිපති වශයෙන් පත්කරන ලදි. මේ පත්වීම කෙරුණේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වැනි සංශෝධනය ක්‍රියාත්මක නොවෙමින් තිබූ තත්ත්වය තුළ, ව්‍යවස්ථා සභාවෙන් ගත යුතුව තිබූ අනුමැතියෙන් තොරව ය.

කෙසේ වෙතත්, ඒ දක්වා මේ නඩුවේ ජ්‍යෙෂ්ඨ නීතිඥයා ඔහු විය. නඩුව තිබුණේ, රජයට ආදායම් උපයා දෙන රේගු දෙපාර්තමේන්තුවට එරෙහිව රෝයල් ෆර්න්වුඩ් පෝර්සිලේන් සමාගමට සහනයක් ලබා ගැනීම වෙනුවෙනි. පෞද්ගලික සමාගම්වලට මිලියන ගණන් දඩ ගෙවන්නට සිදුවන අවස්ථාවල දී එම දඩ මුදල් ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා නඩු පැවරීමට විශාල වශයෙන් එවැනි සමාගම් නීතිඥ ගාස්තු ගෙවන බව ප්‍රසිද්ධ කාරණයකි. මේ කියන නඩුවට අදාළව, රේගුවෙන් ලිහිල් කරන ලද දඩ මුදල වශයෙන් පැවතුණේ, රුපියල් 75,462,012 කි. (රුපියල් හත්කෝටි පනස්හතර ලක්ෂ හැටදෙදහස් දොළහකි).

විවාදාපන්න ආකාරයෙන් නීතිපති පදවියට ඔසවා තැබීමෙන් පසු මේ නඩුවේ පෙත්සම්කාර පාර්ශ්වය වෙනුවෙන් ඔහු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පෙනී නොසිටියත්, නීතිපති වශයෙන් ඔහු රේගු දෙපාර්තමේන්තුව සමග මේ විෂය සම්බන්ධයෙන් කටයුතු කොට ඇති බවට සාක්ෂි 'කලම්බු ටෙලිග්‍රාෆ්' සතුව පවතී. නීතිපතිගේ ලිපිශීර්ෂයක ඔහුගේම අත්අකුරින් රේගු අධ්‍යක්ෂ ජෙනරාල්වරයාට 2009 මාර්තු 31 වැනි දා ලිපියක් ලියන ඔහු, පෙත්සම්කාර සමාගම ඉදිරිපත් කොට ඇති කොන්දේසි පිළිගෙන එකඟතාවකට එන්නැ යි රේගු අධ්‍යක්ෂවරයාට උපදෙස් දෙයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ අදහසක් ගෙනහැර පාමින්, තමාගේම අත්අකුරින් රේගු අධ්‍යක්ෂ ජෙනරාල්වරයාට මොහාන් පීරිස් එසේ ලියා දැන්වූයේ, රේගු සහ වෙනත් බදු වශයෙන් රුපියල් 2616209 ක් (විසිහය ලක්ෂ දහසය දහස් දෙසිය නවයක්) පමණක් අයකර ගන්නා ලෙසයි. පෙත්සම්කාර සමාගම සහ රේගු දෙපාර්තමේන්තුව අතර පැවති ගනුදෙනුව තුළ පැවති කරුණු සහ ඒ සම්බන්ධයෙන් පෙත්සම්කාර සමාගම සහ රේගු දෙපාර්තමේන්තුව දැරූ ස්ථාවරයන් කුමක් විය හැකි වුවත්, නීතිපති වශයෙන් මොහාන් පීරිස් මෙසේ කටයුතු කිරීම බරපතල ආකාරයේ වෘත්තීය විෂමාචාරයක් මෙන්ම, ඉහළම පෙළේ දූෂණයක් වශයෙන් ද සැළකිය හැකිය.

නීති වෘත්තියේ මූලික ශික්ෂාවන් අනුව, යම් නීති හබයක විරුද්ධවාදී දෙපාර්ශ්වය වෙනුවෙන්ම පෙනී සිටීමේ හැකියාවක් නීතිඥයෙකුට නැත. සාමාන්‍ය සදාචාරමය ප්‍රමිතිය අනුව පවා වරදක් වන එය, 1988 ශ්‍රේෂ්ඨාධිකරණ රෙගුලාසි (නීතිඥයන්ගේ කල්ක්‍රියාව සහ අදාළ සුසිරිත්) යටතේ පැහැදිළිවම තහනම් කොට ඇත. එහි රෙගුලාසි අංක 2 යටතේ, 'ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයට අනුයුක්ත කරගන්නා සෑම නීතිඥවරයෙකුටම මෙම රෙගුලාසි බලපාන' බව සඳහන් වෙයි. ඒවා, මොහාන් පීරිස්ට ද බලපාන්නේය.

පැහැදිළිව පෙනෙන්ට තිබෙන මේ නොහොබිනා බැඳියා පිළිගැටුම, ශ්‍රේෂ්ඨාධිකරණ රෙගුලාසි ගණනාවක්ම උල්ලංඝනය කරන්නකි. එම රෙගුලාසි අංක 6 මෙසේ සඳහන් කරයි:

''යම් නීතිඥයෙකු පෙනී සිටින වෘත්තීය කාරියක් තමාගේ පෞද්ගලික ලැදියාවකට සම්බන්ධ වන අවස්ථාවක දී, ඒ ගැන අදාළ සේවාදායකයාට කෙලින්ම හෙළිදරව් කොට, තමා ඔහු වෙනුවෙන් පෙනී සිටීම ගැන එම සේවාදායකයාට විරුද්ධත්වයක් නැති බවට ඔහුගෙන් ලිඛිතව ලබාගත් අවසරයක් සහිතව මිස, එවැනි කිසි පුද්ගලයෙකු හෝ පක්ෂයක් වෙනුවෙන් නීතිඥයෙකු වශයෙන් පෙනී නොසිටිය යුතුය.''

එම රෙගුලාසි අංක 7 මෙසේ සඳහන් කරයිඃ

''සහසම්බන්ධිත වෘත්තීය කාරියක දී තමාගේ එක් සේවාදායකයෙකුගේ අවශ්‍යතාවන්ට පටහැනි වන ලෙස තමාගේ වෙනත් සේවාදායකයෙකු වෙනුවෙන් පෙනී සිටීම හෝ උපදේශන සැපයීම නීතිඥයෙකු නොකළ යුතුය.''

එම රෙගුලාසි අංක 18 මෙසේ සඳහන් කරයිඃ

''නීතිඥයෙකු සේවාදායකයෙකුට උපදෙස් දීමේදීත්, වෙනත් කටයුත්තකදීත්, පූර්ණ අවංක භාවයෙන් කටයුතු කළ යුතුය.''

ඇත්ත වශයෙන්ම, නීති වෘත්තියේ යෙදෙන්නෙකුගෙන් ''ශ්‍රේෂ්ඨාධිකරණ රෙගුලාසිවලින් (නීතිඥයන්ගේ කල්ක්‍රියාව සහ අදාළ සුසිරිත්)'' බලාපොරොත්තු වන අවංක භාවය ඉතා ඉහළ එකකි. ඒ කෙතෙක් ද යත්, පහත සඳහන් අවස්ථාවක දී පවා නීතිඥයෙකු තම රාජකාරියෙන් ඉවත් විය යුතුයඃ

'නීතිඥයෙකු එක විට දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් වෙනුවෙන් පෙනී සිටින අවස්ථාවක දී ඔවුනොවුන්ගේ අවශ්‍යතා අතර ගැටුමක් ඇති වෙතොත්, ඒ සියල්ලන් වෙනුවෙන් පෙනී සිටීමෙන් ඔහු ඉවත් විය යුතුය. එසේ නොවීමට නම්, ඒ කිසි පාර්ශ්වයකට තමාගේ වෘත්තීය සේවාවන් තුළින් අගතියක් සිදු නොවන බවට ඔහුට සහතික විශ්වාසයක් තිබිය යුතුවා පමණක් නොව, එය එසේම යැයි ඉතිරි පාර්ශ්වකරුවන්ගෙන් ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු වන්නේය.' (රෙගුලාසි අංක 8)

දැන් හෙළිදරව් වී ඇති කාරණය අනුව, වෘත්තීය අයෝග්‍යතාවක් මොහාන් පීරිස්ගේ පැත්තෙන් සිදුව ඇති අතර, ඉහත සඳහන් ශ්‍රේෂ්ඨාධිකරණ රෙගුලාසි ඔහු උල්ලංඝනය කර ඇති බව ද පැහැදිලිව පෙනෙන්ට තිබේ.

අතීතයේ දී බොහෝ නීතිඥයන් විනයානුකූල දඬුවම්වලට යටත් කොට ඇත. එකම නඩුවක දී විරුද්ධ පාර්ශ්ව දෙකක් වෙනුවෙන් එක විට පෙනී සිටි ඇතැම් නීතිඥයන්ව නීති වෘත්තියෙන් පවා පළවා හරිනු ලැබ තිබේ. නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ටත් ඉහළින්, කිසිඳු විධිමත් පරිපාටියකින් තොරව පත්කරන ලද රජයේ ප්‍රධාන නීති නිලධාරියා එවැනි අයෝග්‍ය වෘත්තීය හැසිරීමක යෙදෙන විට තත්ත්වය වඩාත් බරපතල ය. නින්දිත ය.

සෙලින්කෝ සමූහ ව්‍යාපාරයේ කඩා වැටීමෙන් පසු ඊට අයත් සේලාන් බැංකුවේ සභාපති වශයෙන් මොහාන් පීරිස්ව පත්කරන ලදි. නීතිපති වශයෙන් අයථා හැසිරීමක නියැලුනු එවැනි පුද්ගලයෙකු බැංකුවක සභාපති වීමට මොන තරම් යෝග්‍ය ද යන්න ප්‍රශ්නයකි. එවැනි පත්වීමක් බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ විශ්වසනීයත්වය කෙරෙහි ඇති කෙරෙන බලපෑම යහපත් නොවෙනු ඇත.

අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායකට, නීතියෙන් සැලසෙන ස්වාධීන නිසි පරීක්ෂණයක් නොදී ඉවත් කිරීමෙන් පසු ඇය වෙනුවට පත්කෙරෙන කිසි තැනැත්තෙකු භාර නොගැනීමට ශ්‍රී ලංකාවේ නීතිඥ සංගමය තීරණය කොට ඇති තත්ත්වය තුළ, දැන් අධිකරණයේ ඉහළම පුටුවට ඔහුව උඩින් ගොස් වාඩි කැරවීමට අදාළ බලවතුන්ට අවශ්‍යව තිබේ ද යන්න, අපට ඉදිරියේ දී බලාගත හැකි කාරණයකි.

ශිරානී බණ්ඩාරනායකගෙන් පසු හිස්වන අගවිනිසුරු ධූරය භාර ගැනීම හිටපු නීතිපති සී.ආර්.ද සිල්වා සහ තවත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් කිහිප දෙනෙකු ප්‍රතික්ෂේප කොට ඇති බවට ආරංචි පැතිර යද්දී, එම උත්තුංග තනතුරට මොහාන් පීරිස් වැනි මතභේදයට තුඩුදෙන පුද්ගලයෙකු පත්කිරීම, අද අප දකින නීතියේ ආධිපත්‍යයේ සීඝ්‍ර ගරාවැටීම තුළ, අර්ථ ගණනාවකින්, තවත් වැදගත් සැතපුම් කණුවක් වනු ඇතැ යි විචාරකයන් කිහිප දෙනෙකු 'කලම්බු ටෙලිග්‍රාෆ්' වෙත අදහස් දක්වමින් පෙන්වා දුනි.